# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1988 අංක 25 දරන
# වෛද්‍ය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1988 ජූලි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

[සහතිකය සටහන් කළේ 1988 ජූලි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 30/88

**වෛද්‍ය ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1988 අංක 25 දරන වෛද්‍ය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**105 වන අධිකාරයේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෛද්‍ය ආඥා පනතේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය වෙනුවට, පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(i) (අ) ලංකා විශ්ව විද්‍යාලයේ හෝ අනුරූප විශ්ව විද්‍යාලයක ; හෝ

(ආ) උපාධි ප්‍රදාන ආයතනයක ;

වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් සහ 32 වන වගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් ප්‍රදානය කරනු ලබන සහතිකයක් දරන්නේ නම් ; හෝ"

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය අවසානයට පහත දැක්වෙන අනුඡේදය එකතු කිරීමෙන් :—

"(iii) ඉහතින්ම වූ අනුඡේද යටතේ ලියාපදිංචි කිරීමට සුදුසුකම් නොලැබූ—

(අඅ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වේ නම් ;

(ආආ) ශ්‍රී ලංකාවෙන් පිටත වෙනත් යම් රටක විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් වන්නා වූ ද අදාළ තැනැත්තා, ඒ විශ්ව විද්‍යාලයට හෝ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් කර ගනු ලැබූ දිනයේ දී ඒ උපාධිය හෝ සුදුසුකම දරන්නකු මේ ආඥා පනත යටතේ වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හිමිකම ගෙන දෙන්නා වූ ද උපාධියක් හෝ සුදුසුකමක් දරන යම් තැනැත්තෙක් වේ නම් ;

(ඇඇ) වෛද්‍ය නිලධරයකුගේ තත්ත්වයෙන් යටත් පිරිසෙයින්, සමස්තයක් වශයෙන් අවුරුදු පහක කාර්යක්ෂමව සහ සතුටු

දායක සේවා කාලයක් ඇත්තේ නම් සහ

(ඇඇ) 32 වන වගන්තිය යටතේ වෛද්‍ය සභාව විසින් දෙන ලද සහතිකයක් දරන්නේ නම් ";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදය සහ (ii) වන අනුඡේදය වෙනුවට පහත දැක්වෙන (i) වන සහ (ii) වන අලුත් අනුඡේද ආදේශ කිරීමෙන් :—

"(i) ලංකා විශ්ව විද්‍යාලයේ හෝ අනුරූප විශ්ව විද්‍යාලයක හෝ උපාධි ප්‍රදාන ආයතනයක වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් දරන්නේ නම් ; හෝ

(ii) ලංකා විශ්ව විද්‍යාලයේ හෝ අනුරූප විශ්ව විද්‍යාලයක හෝ උපාධි ප්‍රදාන ආයතනයක වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් ලබා ගැනීම සඳහා අවශ්‍ය විභාගය සමත් වී ඇති නමුත්, ඔහු වෙත ඒ උපාධිය පිරිනැමීමේ දී ඒ විශ්ව විද්‍යාලයේ හෝ උපාධි ප්‍රදාන ආයතනයේ ප්‍රමාදයක් නිසා ඒ උපාධිය ලබා නොමැත්තේ නම් ";

(4) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය අවසානයට පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් :—

"(iv) ඉහතින්ම වූ අනුඡේද අතුරෙන් යම් අනුඡේදයක් යටතේ තාවකාලික වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම් නොලැබ—

(අඅ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වේ නම් ;

(ආආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් රටක විශ්ව විද්‍යාලයක හෝ වෛද්‍ය විද්‍යාලයක වෛද්‍ය විද්‍යාවේදී උපාධියක් හෝ ඊට සමාන සුදුසුකමක් වන්නා වූ ද අදාළ තැනැත්තා ඒ විශ්ව විද්‍යාලයට හෝ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් කර ගනු ලැබූ දිනයේ දී ඒ උපාධිය හෝ සුදුසුකම දරන්නකු මේ ආඥා පනත යටතේ වෛද්‍ය වෘත්තිකයකු ලෙස ලියාපදිංචි කරනු ලැබීමට හිමිකම ගෙන දෙන්නා වූ ද උපාධියක් හෝ සුදුසුකමක් දරන යම් තැනැත්තෙක් වේ නම් ;

(ඇඇ) වෛද්‍ය නිලධරයකුගේ තත්ත්වයෙන් යටත් පිරිසෙයින්, සමස්තයක් වශයෙන් අවුරුදු පහක කාර්යක්ෂම සහ සතුටුදායක සේවා කාලයක් ඇත්තේ නම්.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (2අ) උපවගන්තියේ (අ) ඡේදයේ (i) අනුඡේදයේ (අ) කරුණෙහි "වතු ඇපොතිකරිවරයෙකු වශයෙන්, හෝ" යන වචන වෙනුවට, "වත්තක හෝ රජයේ සේවයේ වතු ඇපොතිකරිවරයකු වශයෙන් හෝ" යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කිරීමෙන් සහ ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) කිසිම තැනැත්තෙක්, ඔහු මනා චරිතයකින් යුක්ත නම් සහ ලංකා විශ්ව විද්‍යාලයේ හෝ අනුරූප විශ්ව විද්‍යාලයක් හෝ උපාධි ප්‍රදාන ආයතනයක් විසින් පිරිනමනු ලැබූ හෝ ප්‍රදානය කරනු ලැබූ දන්ත වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ අභිඥාන පත්‍රයක් දරන්නේ නම් මිස, දන්ත වෛද්‍යවරයෙකු වශයෙන් ලියාපදිංචි කරනු නොලැබිය යුතු ය.".

5. 69 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 69අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 69අ වගන්තිය ඇතුළත් කිරීම.

"සෑම වරදක්ම සංඥේය වරදක් විය යුතු බව.

69අ. (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පටහැනිව කුමක් සඳහන් වුවද, මේ ආඥා පනත යටතේ වූ සෑම වරදක්ම, ඒ පනතේ අර්ථානුකූලව සහ සංඥේය වරදක් විය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්ය සඳහා බලය ලත් නිලධරයකු වශයෙන් යම් ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයකු හෝ යම් සෞඛ්‍ය සේවා වෛද්‍ය නිලධරයකු අමාත්‍යවරයා විසින් ලියවිල්ලක් මගින් පත් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උප වගන්තිය යටතේ පත් කරන ලද සෑම බලයලත් නිලධරයකුම, මේ ආඥාපනත යටතේ වූ යම් වරදකට අදාළව, ඒ පනත මගින් සාම නිලධරයකු වෙත පැවරුණු යම් බලයක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ අර්ථානුකූලව සාම නිලධරයකු වශයෙන් සලකනු ලැබිය යුතු ය".

ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 74 වන වගන්තිය, "දන්ත වෛද්‍ය වරයා" යන අර්ථ කථනයට පෙරාතුවම, පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

' "උපාධි ප්‍රදාන ආයතනය" යන්නෙහි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි දී ඇති අර්ථයම ඇත්තේ ය;'.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.